# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,485 - 2026 අප්‍රේල් මස 17 සිකුරාදා - 2026.04.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මැයි මස 08 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අප්‍රේල් මස 24 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

“යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.”

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82772 - (2026/04)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැළකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.
මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 මැයි මස 18 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 මාර්තු මස 23 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පොළොන්නරුව | තමන්කඩුව | තමන්කඩුව පළාත කොට්ඨාසයේ කඳුරුවෙල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොළොන්නරුව |

04 - 205

---

**ශ්‍රී ලංකා පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසය**

ශ්‍රී ලංකා පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසයේ පවතින උප සේවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි (විශේෂඥ ශල්‍ය වෛද්‍ය) පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවයේ හා පෞද්ගලික සේවයේ විශේෂඥ ශල්‍ය වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීම.

පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසයේ පවත්නා උප සේවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි (විශේෂඥ ශල්‍ය වෛද්‍ය) තනතුරේ නිලධරයකුගේ පුරප්පාඩුව සපුරාලීම සඳහා දැනට රාජ්‍ය සේවයේ හා පෞද්ගලික සේවයේ නියුතු විශේෂඥ ශල්‍ය වෛද්‍යවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. සුදුසුකම් සපුරා ඇති විශේෂඥ ශල්‍ය වෛද්‍යවරුවන් පහතින් දක්වා ඇති ආකෘති පත්‍රය අනුව, සකස් කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතික පිටපත් ද සමග බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙලවරෙහි "උප සේවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි (විශේෂඥ ශල්‍ය වෛද්‍ය)" යනුවෙන් සඳහන් කර **2026.05.18** දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, අංක 375, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් අයදුම්පත්‍ර පුද්ගලිකව භාර නොදිය යුතු ය.

03. සුදුසුකම් හා පළපුරුද්ද - විශේෂඥ වෛද්‍ය (උපසේවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී)

3.1 ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධිය ලබා තිබීම

3.2 ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ විශේෂඥ වෛද්‍යවරයෙකු ලෙස යාවත්කාලීන කරන ලද පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

3.3 ක්ෂේත්‍රයට අදාළව අවම වසර 01ක පශ්චාත් පත්වීම් පළපුරුද්ද ලබා තිබීම

04. වැටුප් හා වෙනත් දීමනා සහ පහසුකම්

| රාජ්‍ය සේවයෙන් ඉල්ලුම්කරන වෛද්‍යවරුන් හට දීමනා හා පහසුකම් | | පෞද්ගලික සේවයෙන් ඉල්ලුම්කරන වෛද්‍යවරුන් හට වැටුප්, දීමනා හා පහසුකම් |
|---|---|---|
| උප සේවා ජ්‍යෙ. පො. අ. (විශේෂඥ වෛද්‍ය) නිලධාරි තනතුරට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය නිලධරයන් තාවකාලිකව මුදා හැරීමේ දී ගෙවන වැටුප | | උප සේවා ජ්‍යෙ. පො. අ. (විශේෂඥ වෛද්‍ය) නිලධාරි තනතුරට අංක අමප/15/0240/606/2013 දරන 2015.04.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ සෘජුව වෛද්‍යවරුන් බඳවා ගැනීමේ දී ගෙවන වැටුප (සියලු වැටුප් හා දීමනා ශ්‍රී ලංකා පොලීසිය මගින් ගෙවනු ලැබේ.) |
| අදාළ වෛද්‍යවරයා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දරන නිත්‍ය තනතුරට අදාළව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ගෙවනු ලබන වැටුප් හා දීමනා ශ්‍රී ලංකා පොලිසිය මගින් ප්‍රතිපූරණය කරනු ලැබේ. | | මූලික වැටුප<br>උපසේවා ජ්‍යෙ. පො. අ. (වෛද්‍ය) රු. 112,030.00 |
| අමතර සේවා දීමනාව (උපරිම පැය 120 සඳහා) සත්‍ය වශයෙන් සේවය කරනු ලබන පැය ගණන පදනම් ව ශ්‍රී ලංකා පොලීසිය මගින් ගෙවනු ලැබේ. | | විශේෂ දීමනාව<br>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2025 අනුව වැටුපෙන් 22% ක් සමග රු. 1,250.00 |

| | | |
|---|---|---|
| ප්‍රවාහන පහසුකම් | | ජීවන වියදම් දීමනාව - රු. 17,800.00 |
| | | දුෂ්කර දීමනාව - රු. 2,000.00 |
| | | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව - රු. 250 |
| | | ආහාර හා නවාතැන් දීමනාව රු. 34,800.00 |
| | | ප්‍රවාහන පහසුකම් |

4.1 රාජ්‍ය සේවයෙන් බඳවාගනු ලබන වෛද්‍යවරුන් පොලිස් උප සේවයේ ද්විතීයන පදනම මත ද, ඉන් පරිබාහිරව බඳවාගනු ලබන වෛද්‍යවරුන් උපසේවා පදනම මත ද, බඳවා ගැනීම සිදු කරනු ලබයි.

4.2 ද්විතීයන පදනම මත බඳවා ගන්නා වෛද්‍යවරුන් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ගෙවනු ලබන වැටුප් වර්ධක සහ සියලු දීමනා ලබා ගැනීමට හිමිකම් ඇති අතර මෙම බඳවා ගැනීම සෞඛ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨත්වයට බලපෑමක් ඇති නොවේ.

4.3 උපසේවා පදනමින් බඳවා ගන්නා වෛද්‍යවරුන් හට එම තනතුරට හිමි වැටුප් දීමනා හා පහසුකම් සපයනු ලැබේ.

4.4 ප්‍රවාහන පහසුකම් අනුමත දීමනා සහ ඒ ඒ තනතුරට අදාළ අනෙකුත් පහසුකම් සපයනු ලැබේ.

05. සේවා කොන්දේසි

5.1 පොලිස් ආඥාපනතේ විධිවිධාන ඇතුළුව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කොන්දේසි සහ චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් *ගැසට්* නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, වෙනත් උපදෙස් සංග්‍රහවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලට ද යටත් විය යුතු ය.

5.2 සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

5.3 තෝරාගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පත්වීම් ලැබීමට පෙර පසුබිම් පරීක්ෂණයට ලක්කරනු ලබන අතර පොලිස් සේවයට නුසුදුසු වන අයදුම්කරුවන් අයදුම්කාරියන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. අයදුම්පත සමග පහත සහතිකපත්වල පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

* උප්පැන්න සහතිකය
* ජාතික හැඳුනුම්පත/ විදේශ ගමන් බලපත්‍රය
* වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත
* වෛද්‍ය උපාධි සහතිකය
* ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු ලියාපදිංචි සහතිකය
* වෛද්‍ය වෘත්තියට අදාළ විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික

- වැඩි විස්තර සඳහා විද්‍යුත් ලිපිනය - dir.ro@police.gov.lk

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති.

2026 මාර්තු මස 30 දින,
**පොලිස් මූලස්ථානය,**
**කොළඹ 02.**

04 - 237

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

පුරප්පාඩු

**නියෝජ්‍ය සම්බන්ධීකරණ ඉංජිනේරු තනතුර**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින ‘නියෝජ්‍ය සම්බන්ධීකරණ ඉංජිනේරු’ තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග 2026 මැයි මස 04 දින හෝ ඊට පෙර ලැබෙන සේ “පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය).

**1.** වැටුප් පරිමාණය :-

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

**රු. 109,090 – 7 x 2940 / 6 x 3900 – රු. 153,070/- වේ.** (විධායක දීමනාව සහ අනෙකුත් අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 212,000 /- ක් පමණ වේ.)

(ඉහත සඳහන් චක්‍රලේඛයට අනුව 2027 සඳහා තවදුරටත් වැටුප් සංශෝධනය සිදු කිරීමට නියමිතයි).

**2.** වයස් සීමාව :-

අයදුම්පත භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා ඉහත උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**3.** අධ්‍යාපන සුදුසුකම්:-

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක ඉංජිනේරු විද්‍යාවේදී (විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ සිවිල්) උපාධිධාරියෙකු වීම.

**4.** වෘත්තීය සුදුසුකම් :-

2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ පනතට අනුව ස්ථාපිත පිළිගත් ඉංජිනේරු ආයතනයක වරලත් ඉංජිනේරු සාමාජිකත්වය ලබා තිබීම.

**5.** පළපුරුද්ද:-

ඉහත (4) හි දක්වා ඇති වෘත්තීය සුදුසුකම ලබා ගැනීමෙන් පසු, විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයක අවම වශයෙන් වසරක පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

➢ ගොඩනැගිලි නඩත්තු ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**6.** බඳවා ගැනීමේ ක්‍රමය :-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**7.** සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමේ නිර්ණායක :-

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

අවශ්‍ය මූලික සුදුසුකම් සපුරන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. ඒ සඳහා වෙන්කර ඇති මුළු ලකුණු සංඛ්‍යාව සියයකි (100):-

| *අනු අංකය* | *නිර්ණායක* |
|---|---|
| 1 | අමතර අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | සේවා පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන කුසලතා |

**8.** සේවා නියමයන් සහ කොන්දේසි

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබයි. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක, සේවය ස්ථිර කරනු ලැබූ අයදුම්කරුවකු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක (01) වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) පත්වීම ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබේ. මෙම පුරප්පාඩුව නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට බලය ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරු පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iv) තෝරාගනු ලබන අයදුම්කරු, වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ඔහුගේ/ ඇයගේ වැටුපෙන් රජය විසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකින් දායකත්වය ලබා දිය යුතු ය.

(v) තෝරාගනු ලබන අයදුම්කරු වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

(vi) තෝරාගනු ලබන අයදුම්කරු පත්කිරීමට පෙර ඔහු/ ඇය පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම සිදු කරනු ඇත.

**9.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් සිය අයදුම්පතට (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

i. උප්පැන්න සහතිකය;
ii. ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්;
iii. අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
iv. වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
v. පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

**10.** රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

**11.** තනතුර ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**12.** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ සාවද්‍ය යැයි යමෙකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**13.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) හෝ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙළ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**14.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

කුෂානි රෝහණදීර,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
2026 අප්‍රේල් මස 09 දින.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

ආදර්ශ අයදුම්පත්‍රය

............................................... තනතුර

1. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ......................................................................................

(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) : ......................................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (මහතා/මහත්මිය/මෙනෙවිය) ........................................
......................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

3. (අ) (i) පෞද්ගලික ලිපිනය : ..........................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

(ii) විද්‍යුත් තැපැල් ලිපිනය (e-mail) : ..........................................................................

(iii) දුරකථන අංකය : | | | | | | | | | | |

(iv) Whatsapp දුරකථන අංකය : | | | | | | | | | | |

(ආ) (i) කාර්යාලයීය ලිපිනය : ..........................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

(ii) දුරකථන අංකය : | | | | | | | | | | |

(ඇ) තැපැල් මඟින් ලිපි යොමු කළ යුතු ලිපිනය සඳහන් කරන්න.

පෞද්ගලික ☐ රාජකාරි ☐

4. (අ) උපන් දිනය : වර්ෂය .............. මාසය.............. දිනය ..............
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතු ය)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු .............. මාස .............. දින ..............

5. විවාහක/අවිවාහක බව : ..........................................................................

6. ස්ත්‍රී /පුරුෂ භාවය : ..........................................................................

7. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : (ඔව්/ නැත)

8. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු ය)

| උපාධිය | ආයතනය | ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |

9. වෘත්තීය සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු ය)
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

10. වෙනත් සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු ය)
.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................

11. පළපුරුද්ද (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු ය)

| *ආයතනය* | *තනතුර* | *සේවා කාල සීමාව* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර (අදාළ ලේඛන අමුණා තිබිය යුතු ය)

(අ) ආයතනයේ නම හා ලිපිනය : ..............................................................................
..............................................................................
..............................................................................
(ආ) මුල් පත්වීමේ දිනය : ..............................................................................
(ඇ) දැනට දරන තනතුර : ..............................................................................
(ඈ) මාසික මූලික වැටුප : ..............................................................................
(ඉ) දීමනා : ..............................................................................
(ඊ) දළ වැටුප : ..............................................................................

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත්ද? (ඔව්/ නැත)
එසේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න : .......................................................................................
.......................................................................................................................................................

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේද? (ඔව්/ නැත)
එසේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න : .......................................................................................
.......................................................................................................................................................

මෙම අයදුම්පතෙහි ම විසින් සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුසුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත්, වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

දිනය : ..................................
............................................................
අයදුම්කරුගේ අත්සන

දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

(රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ………….......................................... තනතුර දරන …........................ ............................................ ................. මයා/මිය/මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න)

දිනය : ....................................

.........................................................................
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

04 - 269

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (දෙමළ) රෙජිස්ට්‍රාර් තනතුරු

**මන්නාරම දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.
මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 මැයි මස 11 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 මාර්තු මස 20 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මන්නාරම | මාන්දයි බටහිර | මාන්දයි බටහිර කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම. |
| මන්නාරම | මාන්දයි බටහිර | විඩත්තල්තිවු කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම. |

04 - 283

---

**අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව

හානිපූරණය සඳහා වන කාර්යාලය 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාල පනත යටතේ ස්ථාපිත ආයතනයකි. හානිපූරණය සඳහා වන කාර්යාලයේ පවතින පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1 සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ - (මුදල්) - තනතුරු - 01
2 සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ - (ව්‍යාපෘති) - තනතුරු - 01
3 සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ - (නීති) - තනතුරු - 01
4 අභ්‍යන්තර විගණක - තනතුරු - 01

5 තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුරු - 01
6 ජ්‍යෙෂ්ඨ හානිපූර්ණ නිලධාරී තනතුරු - 04
7 අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුරු - 01
8 භාෂා පරිවර්තක - තනතුරු - 02
9 හානිපූරණ නිලධාරී - තනතුරු - 06
10 කළමණාකරණ සහකාර - තනතුරු - 08
11 රියදුරු - තනතුරු - 02

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතිකපත්වල පිටපත් සමඟ 2026 මැයි මස 08 දින හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරී, හානිපූරණය සඳහා වන කාර්යාලය, අංක 40, පළමු මහල, බුත්ගමුව පාර, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත හානිපූරණය සඳහා වන කාර්යාලයේ වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය. www.reparations@gov.lk

අයදුම්කරුවන් සඳහා වන මූලික සුදුසුකම් සහ කොන්දේසි - සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සපුරා තිබිය යුතු ය.

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- එම තනතුරේ කාර්යභාරය ඉටු කිරීමට ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් හෙබි අයෙකු විය යුතු ය.
- අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට වයස් සීමාව අවු. 22 නොඅඩු සහ අවු.45 ට නොවැඩි විය යුතු ය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
- පරිගණක දැනුම සහ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ මනා දැනුමක් තිබීම අමතර වාසියක් සේ සලකනු ලැබේ.
- රජයේ /අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්, තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් යොමු කළ යුතු ය.
- අයදුම්කරුවන් විසින් හානිපූරණය සඳහා වන කාර්යාලය ලබා දී ඇති ආකෘතියට අනුව අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කළ යුතු ය.
- අසම්පූර්ණව ඉදිරිපත් කරන ලද හෝ නිශ්චිත කාලසීමාවෙන් පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- එක් තනතුරකට වඩා අයදුම් කරන අවස්ථාවේදී, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.
- අයදුම්පත් යොමු කරන විට ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය.
- අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.
- ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත හෝ හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත පදනම්ව අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.
- බඳවා ගැනීම පිළිබඳ අවසන් තීරණය හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර බඳවා ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඕනෑම තීරණයක් ගැනීමට එම මණ්ඩලයට හිමිකමක් ඇත.
- තෝරා ගැනීමේ පටිපාටිය - හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන

  ලිඛිත තරග විභාගයක් මඟිනි. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් හෝ/ සහ හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග මත ,

ජේ. ක්‍රිෂ්ණමූර්ති,
අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරී,
හානිපූරණය සඳහා වන කාර්යාලය.

| **සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ- මුදල් (තනතුරු 01)** | **MM 1- 1** |
|---|---|
| තනතුරට අදාළ රාජකාරිය | කාර්යාලයේ සියළුම මූල්‍ය හා ගිණුම්කරණ කාර්යයන් සඳහා උපායමාර්ගික සහ මෙහෙයුම් නායකත්වය ලබා දෙමින්, මූල්‍ය අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම. |
| පත්වීමේ ස්වභාවය | සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) හිමිකම් සහිත ස්ථිර පත්වීමකි. |
| ඉහත සඳහන් කළ සුදුසුකම් සහ කොන්දේසිවලට අමතරව, අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුයි. | **බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**<br><br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ගිණුම්කරණය, මූල්‍ය, වාණිජ්‍ය, ව්‍යාපාර පරිපාලනය හෝ තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම අංශයකින් ලබාගත් උපාධියක්,<br><br>*සහ*<br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, අදාළ තනතුරට සම්බන්ධ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.<br><br>2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය යටතේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක දෙවන අදියර විභාගය සමත්වී තිබීම;<br><br>*සහ*<br><br>තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**<br><br>1. ඉහත සඳහන් කරන ලද බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.<br>2. අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර 05 සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා අපේක්ෂකයින් තෝරාගනු ලබයි. |
| වැටුප් කේතය හා වැටුප් පරිමාණය | MM 1-1-2025 රු. [91,690-10x2,480 - 15x3,450- රු. 168,240]<br>(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව) |
| සේවා ස්ථානය | ප්‍රධාන කාර්යාලය - කොළඹ |

| **සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ- ව්‍යාපෘති (තනතුරු 01)** | **MM 1-1** |
|---|---|
| තනතුරට අදාළ රාජකාරිය | හානිපූරණ වැඩසටහන්වලට අදාළ පර්යේෂණ, ක්ෂේත්‍ර සමීක්ෂණ සහ අවශ්‍යතා ඇගයීම් සිදු කිරීම. එම සොයා ගැනීම් විශ්ලේෂණය කිරීම සහ ඉහළ බලධාරීන් වෙත ඉදිරිපත් කිරීම සඳහා සාක්ෂි මත පදනම් වූ වාර්තා සකස් කිරීම. |
| පත්වීමේ ස්වභාවය | සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) හිමිකම් සහිත ස්ථිර පත්වීමකි. |

**සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ- ව්‍යාපෘති (තනතුරු 01) (*සම්බන්ධිතයි*)**

| | |
|---|---|
| ඉහත සඳහන් කළ මූලික සුදුසුකම් සහ කොන්දේසිවලට අමතරව, අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුයි. | **බාහිර අයදුම්කරුවන් :**<br><br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, උපදේශනය සහ මනෝ විද්‍යාව, ව්‍යාපෘති කළමනාකරණය, සංඛ්‍යාලේඛන හෝ තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම අංශයකින් ලබාගත් උපාධියක් ;<br><br>*සහ*<br><br>2. ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, අදාළ තනතුරට සම්බන්ධ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**<br><br>1. ඉහත සඳහන් කරන ලද බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.<br>2. අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර 05 සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා අපේක්ෂකයින් තෝරාගනු ලබයි. |
| වැටුප් කේතය හා වැටුප් පරිමාණය | MM 1-1-2025 රු. [91,690-10x2,480 - 15x3,450- රු. 168,240]<br>(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව) |
| සේවා ස්ථානය | ප්‍රධාන කාර්යාලය - කොළඹ |

| **සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ- නීති (තනතුරු 01)** | **MM 1-1** |
|---|---|
| තනතුරට අදාළ රාජකාරිය | කාර්යාලයට සම්බන්ධ නඩු කටයුතු, මැදිහත්වීම් සහ අනෙකුත් නෛතික ක්‍රියාපටිපාටීන් වලට අදාළ නීතිමය ලේඛන, නඩු ගොනු සහ වෙනත් වාර්තා සකස් කිරීම, සමාලෝචනය කිරීම සහ සම්පාදනය කිරීම. අවශ්‍ය අවස්ථාවන්හිදී අධිකරණ, විනිශ්චය සභා සහ අනෙකුත් නෛතික වේදිකාවන් ඉදිරියේ හානිපූරණය සඳහා වන කාර්යාලය නියෝජනය කිරීම. |
| පත්වීමේ ස්වභාවය | සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) හිමිකම් සහිත ස්ථිර පත්වීමකි. |
| ඉහත සඳහන් කළ සුදුසුකම් සහ කොන්දේසිවලට අමතරව, අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුයි. | **බාහිර අයදුම්කරුවන් :**<br><br>ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වීම;<br><br>*සහ*<br><br>නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසු, තනතුරට අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා අපේක්ෂකයින් තෝරාගනු ලබයි. |
| වැටුප් කේතය හා වැටුප් පරිමාණය | MM 1-1-2025 රු. [91,690-10x2,480 - 15x3,450- රු. 168,240]<br>(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව) |
| සේවා ස්ථානය | ප්‍රධාන කාර්යාලය - කොළඹ |

| අභ්‍යන්තර විගණක (තනතුරු 01) | MM 1-1 |
|---|---|
| තනතුරට අදාළ රාජකාරිය | ආයතනයේ මූල්‍ය පරිපාලනය සහ මෙහෙයුම් පාලනයන්හි ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය ඇගයීම සඳහා අභ්‍යන්තර විගණන සැලසුම් කිරීම, සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.<br><br>ආදායම නිසි ලෙස එකතු කරන බවත්, මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව වියදම් සිදු කරන බවත්, වත්කම් සුරක්ෂිතව ඇති බවත්, නිසි ලෙස වාර්තා කර ඇති බවත් සහතික කිරීම. |
| පත්වීමේ ස්වභාවය | සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) හිමිකම් සහිත ස්ථිර පත්වීමකි. |
| ඉහත සඳහන් කළ මූලික සුදුසුකම් සහ කොන්දේසිවලට අමතරව, අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුයි. | **බාහිර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**<br><br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය, මූල්‍ය, වාණිජ්‍යය, ව්‍යාපාර පරිපාලනය හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම අංශයකින් ලබාගත් උපාධියක්;<br><br>*සහ*<br><br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.<br><br>2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය යටතේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක දෙවන අදියර විභාගය සමත්වී තිබීම;<br><br>*සහ*<br><br>තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද -<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**<br><br>1. ඉහත සඳහන් කරන ලද බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.<br>2. අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර 05 සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා අපේක්ෂකයින් තෝරාගනු ලබයි. |
| වැටුප් කේතය හා වැටුප් පරිමාණය | MM 1-1-2025 රු. [91,690-10x2,480 - 15x3,450- රු. 168,240]<br>(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව) |
| සේවා ස්ථානය | ප්‍රධාන කාර්යාලය - කොළඹ |

| තොරතුරු තාක්ෂණ නිලධාරී (තනතුරු 01) | JM 1-1 |
|---|---|
| තනතුරට අදාළ රාජකාරිය | පරිගණක දෘඩාංග, මෘදුකාංග, මෙහෙයුම් පද්ධති, ජාල, මුද්‍රණ යන්ත්‍ර සහ ස්කැනර් යන්ත්‍ර ස්ථාපනය කිරීම, වින්‍යාසගත කිරීම සහ නඩත්තු කිරීම. එමෙන්ම, පරිගණක සහ ජාල පද්ධති අඛණ්ඩව අධීක්ෂණය කිරීම, නඩත්තු කිරීම සහ සහතික කිරීම. |

| **තොරතුරු තාක්ෂණ නිලධාරී (තනතුරු 01)** (*සම්බන්ධිතයි*) | **JM 1-1** |
|---|---|
| පත්වීමේ ස්වභාවය | සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) හිමිකම් සහිත ස්ථිර පත්වීමකි. |
| ඉහත සඳහන් කළ මූලික සුදුසුකම් සහ කොන්දේසිවලට අමතරව, අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුයි. | **බාහිර අයදුම්කරවන්: (පහත 1 හෝ 2 හෝ 3)**<br><br>1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම අංශයකින් ලබාගත් උපාධියක්,<br><br>*හෝ*<br><br>2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද, තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 (NVQ 7) ට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>3. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද, තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 (NVQ 6) ට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම;<br><br>*සහ*<br><br>රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අවුරුදු 05ක පළපුරුද්ද.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**<br><br>1. ඉහත සඳහන් කරන ලද බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.<br><br>2. අදාළ විෂය ක්ෂේත්‍රයෙහි "කළමනාකරණ සහකාර තාක්ෂණික" (MA4) තනතුරක වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | භාෂා නිපුණතාවය, තනතුරට අදාළ අභියෝග්‍යතා පරීක්ෂණය සහ තනතුරට අදාළ විෂය දැනුම ඇතුළත් ලිඛිත තරග විභාගයකින් සහ හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා අපේක්ෂකයින් තෝරාගනු ලබයි. |
| වැටුප් කේතය හා වැටුප් පරිමාණය | JM 1-1-2025 රු. [72,650-10x1,360 - 18x2,040- රු. 122,970]<br>(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව) |
| සේවා ස්ථානය | ප්‍රධාන කාර්යාලය - කොළඹ |

| ජ්‍යෙෂ්ඨ හානිපූර්ණ නිලධාරී (තනතුරු 04) | JM 1-1 |
|---|---|
| තනතුරට අදාළ රාජකාරිය | හානිපූරණය සඳහා වන කාර්යාලයේ අනුමත ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ උපාය මාර්ගික රාමුවලට අනුකූලව, ජීවනෝපාය සහාය සහ මනෝසමාජීය සහාය වැඩසටහන් සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂවරුන් සමග සහයෝගයෙන් සහසම්බන්ධීකරණ කටයුතු කිරීම. |
| පත්වීමේ ස්වභාවය | සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) හිමිකම් සහිත ස්ථිර පත්වීමකි. |
| ඉහත සඳහන් කළ මූලික සුදුසුකම් සහ කොන්දේසිවලට අමතරව, අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුයි. | **බාහිර අයදුම්කරුවන්:**<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය, රාජ්‍ය පරිපාලනය, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, සංවර්ධන විද්‍යාව, කළමනාකරණය හෝ අදාළ තනතුරේ විෂයය ක්ෂේත්‍රයට අදාළ ඕනෑම අංශයකින් ලබාගත් මූලික උපාධියක්,<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**<br><br>1. ඉහත සඳහන් කරන ලද බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.<br><br>2. MA-3 තනතුරක විෂය ක්ෂේත්‍රයකට අදාළව අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, මෙයට පීඩාවට පත් ප්‍රජාව සමග කටයුතු කිරීමේ දී ලබාගත් අවම වශයෙන් වසර තුනක (03) ක්ෂේත්‍ර මට්ටමේ පළපුරුද්දක් ඇතුළත් විය යුතු ය. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | භාෂා නිපුණතාවය, අභියෝගතා පරීක්ෂණය සහ තනතුරට අදාළ විෂයය දැනුම ඇතුළත් ලිඛිත තරග විභාගයකින් සහ හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා අපේක්ෂකයින් තෝරාගනු ලබයි. |
| වැටුප් කේතය හා වැටුප් පරිමාණය | JM 1-1-2025 රු. [72,650-10x1,360 - 18x2,040- රු. 122,970]<br>(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව) |
| සේවා ස්ථානය | ප්‍රධාන කාර්යාලය - කොළඹ |

| අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (කොන්ත්‍රාත් පදනම මත) තනතුරු - 01 | |
|---|---|
| තනතුරට අදාළ රාජකාරිය | අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල්, ආයතනයේ කළමනාකාරිත්වය සහ බාහිර පාර්ශවකරුවන් අතර ප්‍රධාන සම්බන්ධීකරණ නිලධාරියා ලෙස කටයුතු කිරීම.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍ර, සටහන් වාර්තා සහ අනෙකුත් නිල ලේඛන කාලෝචිතව හා නිවැරදිව සකස් කිරීම, සම්පාදනය සහ බෙදාහැරීම සිදු කිරීම. |
| පත්වීමේ ස්වභාවය | සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) හිමිකම් සහිත වසර දෙකක කාලසීමාවක් සඳහා වන කොන්ත්‍රාත් පදනම මත පත්වීම. |
| ඉහත සඳහන් කළ මූලික සුදුසුකම් සහ කොන්දේසිවලට අමතරව, අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුයි. | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක් පිළිබඳ ඕනෑම අංශයකින් ලබාගත් උපාධියක්,<br><br>*සහ*<br><br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද. |

| **අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (කොන්ත්‍රාත් පදනම මත) තනතුරු - 01** (*සම්බන්ධිතයි*) | |
|---|---|
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා අපේක්ෂකයින් තෝරාගනු ලබයි. |
| වැටුප් කේතය හා වැටුප් පරිමාණය | මාසික දීමනා :<br>2026 - රු.65,633 + 17,800 = රු. 83,433<br>2027 ආරම්භයේ සිට රු. 72,650+17,800 = රු. 90,450 |
| සේවා ස්ථානය | ප්‍රධාන කාර්යාලය - කොළඹ |

| **භාෂා පරිවර්තක** **MA4**<br><br>ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට - සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට (තනතුරු 01)<br>ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට - දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට (තනතුරු 01) | |
|---|---|
| තනතුරට අදාළ රාජකාරිය | කාර්යාලයේ නිල ලේඛන, වාර්තා, හුවමාරු වන ලිපි, ප්‍රතිපත්ති සහ අනෙකුත් වාර්තා ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට - සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවටත්, ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවටත් නිවැරදි ලෙස හා කාලෝචිත ලෙස පරිවර්තනය කිරීම. |
| පත්වීමේ ස්වභාවය | සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) හිමිකම් සහිත ස්ථිර පත්වීමකි. |
| ඉහත සඳහන් කළ මූලික සුදුසුකම් සහ කොන්දේසිවලට අමතරව, අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුයි. | **බාහිර අයදුම්කරුවන්:**<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, පරිවර්තන අධ්‍යයනය හෝ තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාළ ඕනෑම අංශයකින් ලබාගත් උපාධියක්;<br><br>*සහ*<br><br>තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා අපේක්ෂකයින් තෝරාගනු ලබයි. |
| වැටුප් කේතය හා වැටුප් පරිමාණය | MA4 - රු. [64,320-10x1,360 - 15x1,670- 5x2,040 - රු. 113,170]<br>(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව) |
| සේවා ස්ථානය | ප්‍රධාන කාර්යාලය - කොළඹ |

| **හානිපූර්ණ නිලධාරී (තනතුරු 06)** **MA - 3** | |
|---|---|
| තනතුරට අදාළ රාජකාරිය | ආයතනික විධි නියෝග, ප්‍රතිපත්ති සහ අනුමත මාර්ගෝපදේශයන්ට අනුකූලව හානිපූරණ වන්දි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම, සම්බන්ධිකරණය කිරීම සහ සහාය වීම. |
| පත්වීමේ ස්වභාවය | සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) හිමිකම් සහිත ස්ථිර පත්වීමකි. |

| හානිපූර්ණ නිලධාරී (තනතුරු 06) (*සම්බන්ධිතයි*) | MA - 3 |
|---|---|
| ඉහත සඳහන් කළ මූලික සුදුසුකම් සහ කොන්දේසිවලට අමතරව, අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුයි. | **බාහිර අයදුම්කරුවන් :**<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය, රාජ්‍ය පරිපාලනය, සමාජ විද්‍යාව,දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව,සංවර්ධන අධ්‍යයනය හෝ අදාළ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ඕනෑම අංශයකින් ලබාගත් මූලික උපාධියක්.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන්:**<br><br>ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් සපුරා තිබීම. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා අපේක්ෂකයින් තෝරාගනු ලබයි. |
| වැටුප් කේතය හා වැටුප් පරිමාණය | MA3 - 2025 රු. (53,940-10x800 - 11x1,190- 10x1,320 - 5 x 1,350- රු. 94,980)<br>(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව) |
| සේවා ස්ථානය | ත්‍රිකුණාමලය/කිළිනොච්චි/ වවුනියා/ පුත්තලම/මාතර/ හම්බන්තොට |

| කළමනාකරණ සහකාර- තාක්ෂණික නොවන ( තනතුරු - 08) | MA 1-1 |
|---|---|
| තනතුරට අදාළ රාජකාරිය | පරිපාලන සහ විධායක ශ්‍රේණිවල රාජකාරි සඳහා පහසුකම් සැලසීම සහ සහාය දීම, බලයලත් නිලධාරියාගේ අධීක්ෂණය සහ මගපෙන්වීම යටතේ කාර්යයන් සහ ක්‍රියාකාරකම් ඉටු කිරීම. |
| පත්වීමේ ස්වභාවය | සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) හිමිකම් සහිත ස්ථිර පත්වීමකි. |
| ඉහත සඳහන් කළ මූලික සුදුසුකම් සහ කොන්දේසිවලට අමතරව, අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුයි. | **බාහිර අයදුම්කරුවන් :**<br><br>අ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී<br><br>i. සිංහල/ දෙමළ<br>ii. ගණිතය<br>iii. ඉංග්‍රීසි භාෂාව ( තනතුරට අදාළ නම් ) යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) සමත් වීම;<br><br>*සහ*<br><br>ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයයේදී අවම වශයෙන් විෂයන් තුනක් (03) සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර සමත්ව තිබීම.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන්:**<br><br>පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති, ප්‍රාථමික මට්ටමේ නිපුණතා (Skilled) සහ ප්‍රාථමික මට්ටමේ අර්ධ නිපුණතා (Semi - Skilled) සහ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (Unskilled) යන කාණ්ඩවලට අයත් සේවකයින්ට අයදුම් කිරීමට සුදුසුකම් ඇත. |

| කළමනාකරණ සහකාර- තාක්ෂණික නොවන ( තනතුරු - 08) *(සම්බන්ධිතයි)* | **MA 1-1** |
|---|---|
| | **අධ්‍යාපන සුදුසුකම් :**<br><br>*අ*). අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී<br><br>i. සිංහල/ දෙමළ<br>ii. ගණිතය<br>iii. ඉංග්‍රීසි භාෂාව (තනතුරට අදාළ නම්) යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) සමත් වීම;<br><br>*සහ*<br><br>*වෙනත්:*<br><br>*ආ*) ඉහත සේවක කාණ්ඩය යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | භාෂා නිපුණතාවය, අභියෝග්‍යතා පරීක්ෂණය සහ තනතුරට අදාළ විෂය දැනුම ඇතුළත් ලිඛිත තරග විභාගයකින් සහ හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා අපේක්ෂකයින් තෝරාගනු ලබයි. |
| වැටුප් කේතය හා වැටුප් පරිමාණය | MA 1-1 - 2025 - රු. (46,220-10x540 - 7x630- 4x890 - 20 x 1,190- රු. 83,390)<br>(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව) |
| සේවා ස්ථානය | ප්‍රධාන කාර්යාලය - කොළඹ |

| **රියදුරු (තනතුරු -02)** | **PL3** |
|---|---|
| තනතුරට අදාළ රාජකාරිය | හානිපූර්ණය සඳහා වන කාර්යාලයේ කාර්ය මණ්ඩලය, ලේඛන සහ උපකරණ ප්‍රවාහනය ඇතුළුව නිල වාහන ආරක්ෂිතව සහ කාර්යක්ෂමව ධාවනය කිරීම.<br><br>ඉන්ධන, ලිහිසි තෙල්, ජලය සහ අනෙකුත් දියර මට්ටම් නිරීක්ෂණය කිරීම සහ ඕනෑම යාන්ත්‍රික දෝෂ හෝ අවශ්‍ය නඩත්තු වාර්තා කිරීම ඇතුළුව හොඳ ධාවන තත්වයකින් වාහන නඩත්තු කිරීම. |
| පත්වීමේ ස්වභාවය | සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) හිමිකම් සහිත ස්ථිර පත්වීමකි. |
| ඉහත සඳහන් කළ මූලික සුදුසුකම් සහ කොන්දේසිවලට අමතරව, අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතුයි. | ***බාහිර අයදුම්කරුවන් :***<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයක් (06) සමත් වීම;<br><br>*සහ*<br><br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බර වාහන රියදුරු බලපත්‍රය ලබාගෙන තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) රිය පැදවීමේ පළපුරුද්ද. |

| **රියදුරු (තනතුරු -02)** (*සම්බන්ධිතයි*) | **PL3** |
|---|---|
| | **අභ්‍යන්තර අයදුම්කරුවන් :**<br><br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බර වාහන රියදුරු බලපත්‍රය ලබාගෙන තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) රිය පැදවීමේ පළපුරුද්ද.<br><br>*සහ*<br><br>ප්‍රාථමික අර්ධ නිපුණතා (PL2) හෝ ප්‍රාථමික නුපුහුණු නිපුණතා (PL1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිම. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය කුසලතා පරීක්ෂණයක් හරහා අපේක්ෂකයින් තෝරාගනු ලබයි. |
| වැටුප් කේතය හා වැටුප් පරිමාණය | PL3 - 2025 - රු. (43,280-10x490 - 10x540- 10x590 - 12 x 630- රු. 67,040)<br>(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව) |
| සේවා ස්ථානය | ප්‍රධාන කාර්යාලය - කොළඹ |

**ආදර්ශ අයදුම් පත්‍රය**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

**හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව**

ඉල්ලුම් කරනු ලබන තනතුර : ..............................................................

*අ.* **පෞද්ගලික තොරතුරු**

1. මුලකුරු සමඟ නම (මහතා/ මහත්මිය/ මෙනවිය) : ........................................................................................
........................................................................................................................................

2. මුලකුරුවලින් හැඳින්වෙන නම : ........................................................................................
........................................................................................................................................

3. (*අ.*) උපන් දිනය : ................ ................. ................
අවුරුද්ද මාසය දිනය

(*ආ*) 2026 මැයි මස 08 දිනට වයස : ............... ................. ................
අවුරුදු මාස දින

4. ජාතික හැඳුනුම්පත් අංකය : ........................................................................................

5. සිවිල් තත්ත්වය (විවාහක / අවිවාහක) : ........................................................................................

6. ස්ත්‍රී/ පුරුෂ භාවය (පිරිමි/ ගැහැණු) : ........................................................................................

*ආ. සම්බන්ධ කර ගැනීමේ තොරතුරු*

7. ස්ථිර ලිපිනය : ..........................................................................................................................................................

8. ලිපි ලැබිය යුතු ලිපිනය (ස්ථිර ලිපිනය වෙනස් නම්) : ..........................................................................................

9. දුරකතන අංකය : 9.1 නිවස - ..........................................................................
9.2 ජංගම දුරකථන අංකය - ..........................................................................
9.3 WhatsApp අංකය - ..........................................................................

10. විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail)

*ඇ. වර්තමාන රැකියා තොරතුරු*

11. වර්තමාන රැකියාව (තිබේනම්) :

11.1 තනතුර - ..........................................................................................................................................

11.2 ආයතනය - ..........................................................................................................................................

11.3 පෙර රැකියාව - ..........................................................................................................................................

*ඈ. සුදුසුකම් සහ පළපුරුද්ද*

12. සුදුසුකම් :

12.1 අධ්‍යාපන සුදුසුකම් : (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු ය.)

| *උසස් අධ්‍යාපන සුදුසුකම්* | *ආයතනය* | *සම්පූර්ණ කළ දිනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

*අ.පො.ස. (උ.පෙළ) විභාගය වර්ෂය :* ..........................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

*අ.පො.ස. (සා.පෙළ) විභාගය* වර්ෂය : ......................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

12.2 වෘත්තීය සුදුසුකම් : (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු ය.)

| *පාඨමාලාව* | *ආයතනය* | *සම්පූර්ණ කළ දිනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

12.3 *වෙනත් සුදුසුකම් :*

.............................................................................................................................................................
.............................................................................................................................................................
.............................................................................................................................................................
.............................................................................................................................................................

12.4 *භාෂා කුසලතා :* පහත දක්වා ඇති පරිදි ABCD අක්ෂරවලින් සුදුසු අක්ෂරය අදාළ කොටුවෙහි ඔබේ ප්‍රවීණතාවයේ මට්ටම දක්වන්න.)

| *භාෂාව* | *කියවීම* | *ලිවීම* | *කථනය* |
|---|---|---|---|
| සිංහල | | | |
| දෙමළ | | | |
| ඉංග්‍රීසි | | | |
| අනෙකුත් (සඳහන් කරන්න) | | | |

A - පූර්ණ නිපුණතා
B - මධ්‍යස්ථ
C - දුෂ්කරතාවයෙන් යුතුව කළමනාකරණය කළ හැකිය.
D - නිපුණතාවක් නැත.

13. අයදුම් කරන තනතුරට අදාළ සේවා පළපුරුද්ද :

.............................................................................................................................................................
.............................................................................................................................................................
.............................................................................................................................................................
.............................................................................................................................................................

14. ලිඛිත තේරීම් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) ....................................................................

***ඉ. අයදුම්පත්‍රය සහතික කිරීම :***

ඉහත ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි සහ සත්‍ය බව මෙයින් සහතික කරමි. / ප්‍රකාශ කරමි.

දිනය : ............ ........................................................

අයදුම්කරුගේ අත්සන.

ඊ. (මෙම කොටස රාජ්‍ය අංශයේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අපේක්ෂකයින් සඳහා පමණක් අදාළ වේ.)

**දෙපාර්තමේන්තු / ආයතනික ප්‍රධානියාගේ සහතික කිරීම :**

මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ සේවය කරනු ලබන ...................................... මහතා/ මහත්මිය/ මෙනවිය දැනට ................... තනතුරේ රාජකාරි කරනු ලබන බවත්, ඔහුගේ/ ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන බවත්, ඔහුට / ඇයට එරෙහිව කිසිදු විනයානුකූල පියවරක් ගෙන නොමැති බවත්, අනාගතයේ දී එවැනි පියවර ගැනීමට තීරණය කර නොමැති බවත්, මෙයින් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැකි ය. / නොහැකි ය.

දිනය : .................................... ................................................................,

දෙපාර්තමේන්තු/ ආයතනික ප්‍රධානියාගේ අත්සන.

නම : .......................................................................

තනතුර : .................................................................................

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය : .........................................................................

(නිල මුද්‍රාව තබන්න)

04 - 288

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

දෙමළ මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**යාපනය දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/ පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 මැයි මස 11 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 මාර්තු මස 26 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| යාපනය | මරුදන්කේණි | කුඩතනයි කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වඩමරාච්චි කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |

| | | | |
|---|---|---|---|
| යාපනය | නල්ලූර් | කොක්කුවිල්/ කෝණ්ඩාවිල් කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වඩමරාච්චි කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |
| යාපනය | පේදුරු තුඩුව | පේදුරුතුඩුව කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වඩමරාච්චි කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |

04 - 289

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 24ක් සීමිත පදනම මත සම්පූර්ණ කිරීමට පවත්වන සීමිත තරඟ විභාගය සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණකර ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Applications – Recruitment Exams / E.B. Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම

**2026 අප්‍රේල් මස 20 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 මැයි මස 18 වැනි දින ප.ව. 09.00ට අවසන්වේ.**

නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

මෙම විභාගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2026 ජූලි මස කොළඹ දී පවත්වනු ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට යටත්ව මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට විභාග කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත.

1. මෙම නිවේදනයේ “පත්කිරීම් බලධරයා” යනුවෙන් අදහස් කරනුයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද “සේවය” යන පදයෙන් අදහස් කරනුයේ වෙනත් ආකාරයකින් සුවිශේෂී කොට සඳහන්කර නොමැති අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය ද වේ.

2. බඳවා ගැනීමේ ක්‍රමය :

ප්‍රශ්න පත්‍ර 03කින් යුතු ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන්ගෙන් සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ලබාගත් අපේක්ෂකයන් අතරින් ලබා ඇති ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්කිරීම් බලධරයා විසින් තීරණය කරන අපේක්ෂකයන් සංඛ්‍යාවක් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, එම අපේක්ෂකයන්ගේ සුදුසුකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

මෙම බඳවා ගැනීම මගින් පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය අනුව තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. තව ද අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය, අංක 2310/29 දරන 2022.12.14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිහි 92 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ.

3. සේවා කොන්දේසි හා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

i. අංක 1670/32 සහ 2010.09.10 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් සිදුකර ඇති හා මතුවට කරනු ලබන සංශෝධනවලට යටත්ව එම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට ද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද මෙම පත්වීම යටත් වේ.

ii. මෙම පත්වීම ස්ථිරය. එනමුත්, පත්වීම්ලාභීන් එක් වර්ෂයක පරිවාස කාලයකට යටත්වන අතර එම පරිවාස කාලය තුළදී යථා පරිදි සියලු අවශ්‍යතා සපුරාලීමට සමත් වුවහොත් පමණක් පරිවාස කාලය අවසානයේ පත්වීම ස්ථිර කරනු ලැබේ.

iii. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට පත්වීම්ලාභීන් යටත් විය යුතු වේ. තව ද පත්වීම්ලාභීන් විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු වේ.

iv. අයදුම්කරු විසින් විභාගය සඳහා පෙනී සිටීමට අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍යය වේ.

v. පිළිගත හැකි හේතුවක් ලිඛිතව දැනුම් දීමකින් තොරව, පත් කිරීමේ ලිපියෙහි සඳහන් නියමිත දිනයේදී සේවයට වාර්තා කිරීමට අසමත් වන තැනැත්තෙකුගේ පත්වීම අවලංගු වේ.

vi. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛ විධිවිධාන අනුව පත්වීම්ලාභීන් විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු ය.

vii. පත්වීම් ලැබ වසර 03ක් ගතවීමට පෙර සේවා ව්‍යවස්ථාවෙහි දැක්වෙන ආකාරයට පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

4. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

රු. 82,150 **-** 10 **x** 2,400 – 8 **x** 2,940 **-** 17 **x** 3,900 – රු. 195,970/- (SL 1 – 2025) වේ.

මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

5. සුදුසුකම් :

5.1. අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත් උපාධියක් හෝ ලබා තිබීම.

5.2. පළපුරුද්ද :

සිය පත්වීම්වල ස්ථිර කර ඇති, අයදුම්පත් කැඳවීමේ නිවේදනය, ගැසට් පත්‍රයේ පළ කරන දිනට හෝ ඊට පෙර ඉහත 5.1 හි සඳහන් සුදුසුකම් සහිත රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි වැටුප් කේත අංක MN - 1 - 2025 හෝ ඊට ඉහළ MN වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන හෝ SL - 1 - 2025 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක / තනතුරක අවුරුදු පහකට (05) නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබිය යුතු ය.

5.3. කායික සුදුසුකම් **:**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි මැනවින් ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

5.4. වෙනත් සුදුසුකම් **:**

i. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

ii. අයදුම්කිරීමට සුදුසුකම් ලැබීමට පූර්වාසන්නයෙන් වූ වසර පහක කාලසීමාව තුළ නියමිත දිනයන්හිදී සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

iii. සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා එයට සංශෝධන වශයෙන් පළකළ චක්‍රලේඛ විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

iv. මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කරන දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

5.5. සුදුසුකම් පිළිබඳ සීමා :

i. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

ii. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සීමිත තරඟ විභාගය සඳහා වාර තුනකට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තකුට අවසර නොමැත.

6. විභාග කොන්දේසි :

i. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර ඒ සඳහා එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතු ය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි සඳහන් කරනු ලබන විභාග මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රධාන ප්‍රශ්න පත්‍ර 03ටම පෙනී සිටිය යුතු ය.

ii. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා බව ජංගම දූරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iii. මෙම විභාගයේ විභාග ගාස්තුව රු. 1200/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card),
(ii) මාර්ගගත ගෙවීම් පහසුකම සක්‍රිය කර ඇති ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with online payment facility),
(iii) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය මගින් (Online Banking Method, Bank of Ceylon),
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment).

*සටහන :* ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

iv. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

v. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් මත ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීම හෝ කරනු නොලැබේ.

vi. අයදුම්පතේ ද විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතිකකර තිබිය යුතු ය. විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවාගත යුතු ය.

*සටහන :* ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකමක් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

vii. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂාකර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

viii. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරිය විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

ix. අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

x. විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය .

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකිවන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කරගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත්කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

7. විභාග ප්‍රතිඵල :

පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරියගේ තීරණය අවසන් තීරණය වේ.

8. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අයදුම්පත්‍ර පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අපේක්ෂකයකු ඉදිරිපත්කර ඇති තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් හෝ ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

පත්වීම් ලබා ගැනීමෙන් පසුව ඉහත සඳහන් කරුණු පිළිබඳව අනාවරණය වුවහොත්, අදාළ පත්වීම යටතේ වැටුප් හා දීමනා ලෙස රජය විසින් ගෙවා ඇති සියලු මුදල් ද ආපසු අය කර ගනු ලැබේ.

9. බඳවා ගැනීමේ ක්‍රමය

9.1 ලිඛිත විභාගය :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර 03කින් යුතු ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක්

විෂයය සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය හා ප්‍රශ්න පත්‍රය සඳහා ලබා දෙන කාලය පහත පරිදි වේ;

| අනු අංකය | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් විය යුතු ලකුණු ප්‍රමාණය | කාලය |
|---|---|---|---|---|
| 1 | අවබෝධය | 100 | 40 | පැය 02 යි. |
| 2 | විෂයානුබද්ධ අධ්‍යයනය | 100 | 40 | පැය 01 යි. |
| 3 | ක්‍රමසම්පාදනය | 100 | 40 | පැය 02 යි. |

9.2 විෂය නිර්දේශය :

**විෂයය අංක 01 - අවබෝධය**

පාඨ කාණ්ඩය අපේක්ෂකයා හමුවේ තබනු ලැබේ. මින් ඇතැම් පාඨයන් ආශ්‍රයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශයන් කාණ්ඩයක් ඉදිරිපත් කරනු ලැබේ. ඉන් එකක් එම පාඨයේ අන්තර්ගත කරුණුවලට වඩාත් හොඳින්ම ගැළපෙනු ඇත. ඉතාමත්ම උචිත පාඨය තෝරා දක්වන ලෙස අපේක්ෂකයාට නියම කරනු ලැබේ. අනිකුත් පාඨයන් අළලා ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අපේක්ෂකයා එම පාඨවල අර්ථය වටහා ගන්නා අන්දම පරීක්ෂා කිරීම සඳහාය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

**විෂයය අංක 02 - විෂයානුබද්ධ අධ්‍යයනය**

අපේක්ෂකයකු සතු නිර්මාණාත්මකව සිතීමේ ශක්තීන් සහ ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම අරමුණු කොට ගෙන සම්පාදිත ප්‍රශ්න පත්‍රයකි. මෙම ප්‍රශ්න පත්‍රයට වර්තමාන ශ්‍රී ලංකාවේ ආර්ථික හා ක්‍රමසම්පාදනය සම්බන්ධ තොරතුරු ආශ්‍රිත ග්‍රන්ථ හා ප්‍රකාශන පදනම් කොට ඉස්මතුවන ගැටලු අවස්ථා එකක් හෝ කිහිපයක් අපේක්ෂකයා වෙත ඉදිරිපත් කර ඒවාට විසඳුම් දක්වන ලෙස නියම කරනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

**විෂයය අංක 03 - ක්‍රමසම්පාදනය**

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අරමුණ වන්නේ ක්‍රමසම්පාදන මූලධර්ම සහ ක්‍රමසම්පාදන උපක්‍රම පිළිබඳව අපේක්ෂකයන්ගේ මූලික දැනුම පිරික්සීමයි.

9.3 සම්මුඛ පරීක්ෂණය :

i. සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන් අතරින් ලබා ඇති ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරන අපේක්ෂකයන් සංඛ්‍යාවක් සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට අදාළ කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට අනුකූලව රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ.

ii. ඒ අනුව, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අපේක්ෂකයන්ගේ සුදුසුකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ. මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලබන අතර එහිදී මූලික සුදුසුකම් සපුරා ඇති බවට තහවුරු කෙරෙන අපේක්ෂකයන් සේවයේ III ශ්‍රේණියට පත් කිරීම සඳහා තෝරා ගනු ලැබේ.

***සැලකිය යුතුයි :***
හුදෙක් සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

10. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්. ආලෝකබණ්ඩාර**

ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

2026 මාර්තු මස 30 දින.

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

රජයේ භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

1.0 රජයේ භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (සේවා ව්‍යවස්ථාවේ 08 ඡේදය) රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් **2026 අගෝස්තු මස කොළඹ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම නිවේදනයට අනුව අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම්කළ හැක්කේ **රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ට පමණි.**

2.0 ඉහත සඳහන් සේවයේ ශ්‍රේණියට අදාළව පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් පරිදි වේ.

| *අනු අංකය* | *විභාගයේ නම* | *සංකේත නාමය* |
|---|---|---|
| 01 | රජයේ භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 | TRL - I |

3.0 මෙම විභාගය සම්බන්ධව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත. අයදුම්කිරීමේ දී මූලික තොරතුරු වන නම, ජාතික හැඳුනුම්පත් අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය, දුරකථන අංකය නිවැරදිව ඇතුළත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව වැරදි තොරතුරු ඇතුළත් කිරීම හේතුවෙන් විභාග ප්‍රවේශ පත්‍රයක් නොලැබීම හෝ විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව නොලැබීම හෝ විභාග ප්‍රතිඵල නිකුත් නොකිරීම හෝ සම්බන්ධයෙන් වගකීම අයදුම්කරුවන් සතු වන බව ද සැලකිය යුතු ය.

4.0. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පතක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. නිවැරදිව හා පැහැදිළිව පිළියෙළ කරනු ලබන අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2026.05.17 දින හෝ ඊට ප්‍රථම **සහකාර අධ්‍යක්ෂ, විභාග, 28/10 , ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, මලලසේකර මාවත, කොළඹ 07** වෙත ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් සහකාර අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම, තනතුරු නාමය සඳහන් විය යුතු ය. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

5.0. (i) අයදුම්පතේ ශීර්ෂ අංක 1.0 සිට 4.0 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන අයදුම්පත "ඒ4" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කරගත යුතුය. අයදුම්පත යතුරු ලියනය කර පිළියෙල කර ගත හැකි වුව ද, එය අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන්ම පිළියෙළ කළ යුතු අතර ඒවා එම භාෂාවෙන් ම පිරවිය යුතුය. විභාග අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කරන්න.

**විභාග අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම 2026.04.17 දින සිට 2026.05.17 දින දක්වා වන කාලය තුළ පමණක් සිදු කළ හැක.**

6.0 i. විභාග ගාස්තු - පළමුවන වරට මෙම විභාගයට අයදුම් කරන නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එක් විෂයකට රු. 250ක් බැගින් ගෙවිය යුතු වේ.

ii. විභාග ගාස්තු පහත දැක්වෙන ගිණුම වෙත බැර කළ යුතු වේ.

ගිණුමේ නම - ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
ගිණුම් අංකය - 310100119027430
බැංකුව - මහජන බැංකුව - බම්බලපිටිය ශාඛාව

iii. ගිණුම වෙත මුදල් ගෙවීමේදී මුදල් ගෙවන්නා ලෙස අයදුම්කරුගේ නම ද, අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ද, මුදල් තැන්පත් කිරීමට හේතුව යන ස්ථානයේ ඔබට අදාළ විභාගයේ සංකේත නාමය ද ඇතුළත් කර මුදල් තැන්පතු පත සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරුගේ නමින්ම ලබාගත් ලදුපතක් අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය. එම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම සුදුසුය.

(විභාගයේ සංකේත නාමය 02 ඡේදයේ දක්වා ඇති පරිදි විය යුතු ය)

7.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

8.0 සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරින්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරින්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එතෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) බැගින් ලබාගත යුතු වේ.

10.0 විභාග ප්‍රතිඵල ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කිරීමෙන් අනතුරුව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළකරනු ලැබේ. එම ප්‍රතිඵල අනුව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිලධාරින් උසස් කිරීම් කටයුතු සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතු වේ.

11.0 **විෂය නිර්දේශය හා විභාග පරිපාටිය**

**පළමුවන විෂයය - ප්‍රශ්න පත්‍ර අංක 01**

(I) පොදු වැදගත්කමක් ඇති පාඨයකින්,
(II) (අ) නිල ලේඛනයකින් හෝ වාර්තාවකින් හෝ උපුටාගත් කොටසක් සහ
(ආ) පුවත්පත් ලිපියකින් හෝ වාර්තාවකින් උපුටාගත් කොටසක් අයදුම්කරුවන් තම භාෂා පරිවර්තන මාධ්‍යයන් අනුව තෝරා ගත් පහත සඳහන් ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම.

(i) සිංහලෙන් දෙමළ බසට
(ii) සිංහලෙන් ඉංග්‍රීසියට
(iii) දෙමළ බසින් ඉංග්‍රීසියට

ලකුණු 100 යි - පැය 3 ක ප්‍රශ්න පත්‍ර එකකි.

**දෙවන විෂයය - ප්‍රශ්න පත්‍ර අංක 02**

(I) පොදු වැදගත් කමක් ඇති පාඨයකින්,
(II) (අ) නිල ලේඛනයකින් හෝ වාර්තාවකින් හෝ උපුටාගත් කොටසක් සහ
(ආ) පුවත්පත් ලිපියකින් හෝ වාර්තාවකින් උපුටාගත් කොටසක් අයදුම්කරුවන් තම භාෂා පරිවර්තන මාධ්‍යයන් අනුව තෝරා ගත් පහත සඳහන් ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම.

(i) දෙමළ බසින් සිංහලට
(ii) ඉංග්‍රීසියෙන් සිංහලට
(iii) ඉංග්‍රීසියෙන් දෙමළ බසට

ලකුණු 100 යි - පැය 3 ක ප්‍රශ්න පත්‍ර එකකි.

- සාමර්ථ්‍යය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් ලකුණු සියයට හතළිහක් (40%) ක් හෝ ඊට වැඩියෙන් ලබාගත යුතු ය.

*සටහන* - අපේක්ෂකයන්ගේ අත්අකුරු පිළිබඳව සැලකිල්ලක් දක්වනු ලැබේ.

12.0 මෙම විභාග නිවේදනයෙන් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

13.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනවල පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

**එන්.යූ. නිශාන් මෙන්ඩිස්**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා
සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2026 අප්‍රේල් මස 06 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**ආදර්ශ අයදුම්පත්‍රය**

**රජයේ භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ**
**නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025**

**EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN CLASS I OF THE GOVERNMENT TRANSLATORS' SERVICE – 2025**

(සැලකිය යුතුයි : මෙම ආකෘති පත්‍රය නිවැරදිව හා පැහැදිළිව අපේක්ෂකයාගේ / අපේක්ෂිකාවගේ අත් අකුරින්ම පිරවිය යුතුයි.)

1.0 ගැසට් නිවේදනයේ 11 වන ඡේදය අනුව ඔබ පරිවර්තනයෙහි යෙදෙන ආකාරය

<u>**ප්‍රශ්න පත්‍ර අංක 01**</u> :
සිංහලෙන් දෙමළ බසට - 1
සිංහලෙන් ඉංග්‍රීසියට - 2
දෙමළ බසින් ඉංග්‍රීසියට - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

<u>**ප්‍රශ්න පත්‍ර අංක 02**</u> :
දෙමළ බසින් සිංහලට - 4
ඉංග්‍රීසියෙන් සිංහලට - 5
ඉංග්‍රීසියෙන් දෙමළ බසට - 6

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

- ප්‍රශ්න පත්‍ර අංක 01 ට හෝ ප්‍රශ්න පත්‍ර අංක 02 ට හෝ එම ප්‍රශ්න පත්‍ර දෙකටම හෝ පෙනී සිටිය හැකිය.

2.0 පෞද්ගලික තොරතුරු:

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ................................................................................
...............................................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ........................
..............................................................................................................
(උදා : GUNAWARDHANA, H.M.S.K)

2.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) : ...........................................................................
...........................................................................................................................

3.0 සේවා ස්ථානය හා ලිපිනය :

3.1 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ……………...................
.........................................................................................................

3.2 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :
...........................................................................................................................

3.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
..............................................................................................................................................

4.0 4.1 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

4.2 උපන් දිනය : වර්ෂය | | | මාසය | | | දිනය | |

5.0 දුරකථන අංක :

5.1 ජංගම : | | | | | | | | | | |

5.2 ස්ථාවර : | | | | | | | | | | |

6.0 ස්ත්‍රී පුරුෂ බව

ස්ත්‍රී - 1
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

7.0 දැනට දරන තනතුර :

7.1 තනතුර : ..........................................................................
7.2 පත්වීම් ලිපියේ අංකය : .....................................................

8.0 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? : .....................................................................
8.2 එසේ නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව : ..........................................................................
8.3 බැංකුව/ ශාඛාව: ....................................................
8.4 ලදුපත් අංකය: .............................................................
8.5 දිනය : .........................................................................

ලදුපත නොගැලවෙන සේ අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න)

9.0 **අයදුම්කරුගේ සහතිකය**

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම අයදුම්පත ආරම්භයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මා හට හිමිකම් ඇති බවත්, මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීතිරීති පිළිපැදීමට ද එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහකාර අධ්‍යක්ෂ විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය : ................................ .......................................................
අයදුම්කරුගේ අත්සන

10.0 **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

(i) මෙම අයදුම්කරු/ කාරිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින ඒකාබද්ධ සේවයට අයත් භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ භාෂා පරිවර්තකයකු බව ද,
(ii) ඉහත සපයා ඇති විස්තර නිවැරදි බව ද,

(iii) ඔහුගේ / ඇයගේ වැඩ සහ හැසිරීම සෑම විටම සතුටුදායක බව ද, පසුගිය පස් අවුරුදු කාලසීමාව තුළ (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට භාජනය නොවූ බව ද,

(iv) ඔහු /ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද,

(v) නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් මම සහතික කරමි. (අදාළ නොවේ නම් කපා හරින්න.)

.............................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

පදවි නාමය :....................................
ලිපිනය :...........................................
දිනය :.............................................

04 - 204

---

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ ගොඩනැගිලි ඕවර්සියර් තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඕවර්සියර් තනතුරු 01ක් සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.donets.lk වෙබ් අඩවියේ "our services" යටතේ ඇති "Online Applications-Recruitment Exams/E.B.Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026.04.17 දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර 2026.05.18 දින රාත්‍රී 9.00ට අවසන් වේ. මේ සඳහා වන තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2026 ජූලි මාසයේදී කොළඹදී පමණක් පවත්වනු ලැබේ.

දැනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

01. භාෂා මාධ්‍යය : විභාගය සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යය යන තුනෙන්ම පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

02. බඳවා ගැනීමේ සුදුසුකම්

(අ) අධ්‍යාපන සුදුසුකම්

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම;

*සහ*

ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ තොරතුරු තාක්ෂණවේදය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත් වීම.

(ආ) වෘත්තීය සුදුසුකම් :

(I) මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

(II) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

*හෝ*

(III) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු පාඨමාලාව;

*හෝ*

(IV) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

(V) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

(VI) ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු (සිවිල් ඉංජිනේරු) අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

(VII) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

(ඇ) පළපුරුද්ද : ගොඩනැගිලි නඩත්තු කටයුතු පිළිබඳව වසර 02ක පළපුරුද්දක් ලබා තිබිය යුතු ය.

(ඈ) කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

(ඉ) වෙනත් සුදුසුකම් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

03. වයස :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 1996.05.18 දිනෙන් පසු සහ 2005.05.18 දිනට පෙර උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා සුදුසුකම් ඇත.)

04. කාර්යක්ෂමතා කඩඉම : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

05. වැටුප් පරිමාණය (MN 3) : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව මාසික වැටුප් පරිමාණය

**රු.52,250 – 10x 800 – 11 x 1190 – 10 x 1320 – 10 x 1350 – රු. 100,040/- වේ.**

06. අයදුම් කිරීමේ ක්‍රමය :

(අ) මාර්ගගත(online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගත යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බවට බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක්(SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (e mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

07. විභාග ගාස්තු ගෙවීම :

විභාග ගාස්තුව රු.600.00 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
II. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින්(Any Bank Debit card with the Facility of Internet Transactions)
III. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින්(Any Branch of the Bank of Ceylon)

*සටහන :-*

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝශ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

08. විභාගයට ඇතුළත් කර ගැනීම :

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මගින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවිඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ බව පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කරගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලන නොලැබේ.

(*ආ*) අයදුම්කරුවන් විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර, විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේදීම තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. විභාග ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට කිසිවකුට අවසර නොලැබේ.

(*ඇ*) විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඒ සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(*ඈ*) විභාග අයදුම්කරුවන් තමන්ට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු ය.

09. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම, විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගැනීමට හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

10. විභාග ක්‍රමය :

(අ) මෙම විභාගය පහත සඳහන් පරිදි වන ලිඛිත ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

01. **බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01යි. ලකුණු 100යි.**
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත්, තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ය.

02. **විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය - කාලය පැය 03යි. ලකුණු 100යි.**

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

**i.** ගොඩනැගිලි ද්‍රව්‍ය

සිමෙන්ති, හුණුගල්, ගල්, ගඩොල්, තීන්ත වර්ග, වාර්නිෂ් වර්ග, ප්ලාස්ටික් සහ වීදුරු ආදී ගොඩනැගිලි ද්‍රව්‍ය වශයෙන් යොදා ගනු ලබන හොඳ තත්ත්වයේ දැව හඳුනා ගැනීමේ දැනුම

**ii. මූලික ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සහ නඩත්තු කටයුතු**

- අත්තිවාරම්, බිත්ති, ව්‍යුහ කොටස්, වහලය, සිවිලිම, දොර හා ජනේල, බිම හා බිත්ති නිමැවුම් කටයුතු සඳහා ගොඩනැගිලි ඉදිකිරීම්වලදී භාවිතා කරන අමුද්‍රව්‍ය
- වැඩබිම් කළමණාකරණයේ තත්ත්ව පාලනය
- වැඩබිම් කාර්යාලයේ සිට පවත්වාගෙන යායුතු ලියකියවිලි

**iii.** ජල සම්පාදන හා ජලාපවහන

ජල සම්පාදන
- ජල මූලාශ්‍ර, ජල නල අමුද්‍රව්‍ය සහ භාවිතා කරන උපාංග,සියළු අත්‍යවශ්‍ය උපාංග ඇතුළත් නළ එලීම

<u>ජලාපවහන</u>
- රෙගුලාසි, ජලාපවහන උපාංග, වැසිකිළි පෝච්චි, ගලි, වාතාශ්‍රය, මනු වලවල් හා වෙනත් අංග බැහැර කිරීම දක්වා

**iv. විදුලි සැපයුම**

- විදුලි පරිපථ පිළිබඳ දැනුම
- විදුලි උපකරණවල ධාරිතාව
- ආලෝක ප්‍රමාණය අනුව විදුලි බුබුළු සැකසීම
- ගොඩනැගිලි අලංකරණය සඳහා විදුලි ආලෝකකරණය

**v. විදුලි ජනක යන්ත්‍ර**

- විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව හා ඒවාට ඉන්ධන සැපයීම

**vi. වායු සමීකරණ, ගිනි වැළැක්වීමේ උපකරණ**

- ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

**vii. විදුලි සෝපාන**

- ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

(ආ) සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40%ට වැඩි ප්‍රමාණයක් ලබාගත යුතුය.

(ඇ) විභාග ප්‍රතිඵල :

පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු/ මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියළුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරිය විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත. **"විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ".**

11. තෝරා ගැනීමේ ක්‍රමය :

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනට, නිවේදනය ප්‍රකාර සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවන් පත්වීමක් ලැබීමට සුදුසුකම් නොලබන්නේය.

(ආ) ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.)

12. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. එතකුදු වුවත් තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට නිලධාරින් යටත් විය යුතු වේ.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් එම අවස්ථාව වන විට රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර නොසිටීනම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයක් මත අදාළ තනතුරට පත් කරනු ඇත. රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු නම් ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩබැලීම් කාලයකට යටත් වනු ඇත.

13. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

14. මෙම නිවේදනයේ සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව අවසාන තීරණයක් ගැනීම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් සතු වන්නේය.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**කේ.ඒ.පී. ද සිල්වා,**
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්(*වැ.බ.*).

2026 අප්‍රේල් මස 07 දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
අංක 400, "සමාගම් මැදුර",
ඩී.ආර්.විජේවර්ධන මාවත,
කොළඹ 10.

04 - 199

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.